**ශීර්ෂය 194 - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**
**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(**2**) ) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 සැප්තැම්බර් 14 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 හි රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි තවදුරටත් වාර්තා කලයුතු මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනා ගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම් ගත කළ යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා විද්‍යායතනය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය සතු ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ස්ථාපිත ඉඩම අමාත්‍යාංශය වෙත පවරා දීමට අවශ්‍ය මැණුම් කටයුතු සිදු කරමින් පවතින අතර එම වාර්තාව ලද පසු පැවරීමේ නිර්දේශ ඉදිරිපත් කරන බව හෝමාගම ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.<br>කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයට අයත් ඉඩම් ගොඩනැඟිලි තක්සේරු වටිනාකම හඳුනාගැනීම හා ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව දන්වා සිටිමි. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු අගයන් ලබාගැනීමට කටයුතු කරමින් පවති. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

### 1.6.2 දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ක්‍රීඩා නිවහන පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු. මිලියන 138 ක් වාසස්ථාන ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් ඉඩම්වල වටිනාකම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නුවරඑළිය ක්‍රීඩා නිවහන පිහිටි ඉඩමට අදාල ගැලපීම් කඩිනමින් ඉදිරියේදී සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදි මිලදී ගෙන ක්‍රීඩා පාසල්, යෞවන හා ක්‍රීඩා සමාජ වෙත බෙදා දුන් රු. මිලියන 10 ක් වූ ක්‍රීඩා භාණ්ඩ මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වලින් ඉවත්කර ඇතත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම මඟහැරී තිබූ අතර ඉදිරියේදී නිවැරදි ලෙස කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල රු. මිලියන 358 අගයකට ගිණුම් ගත කර ඇතත් එම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ගොඩනැල්ල පිහිටි ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. මෙම ඉඩම පවරා ගැනීමෙන් අනතුරුව තක්සේරු කිරීමේ කටයුතු සිදුකර ගිණුම්ගත කිරීම සිදු කළ හැක. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ඈ) | නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 3ක වටිනාකම රු.300 ක් වූ නාමික අගයකට CIGAS වැඩසටහනෙහි ඉඩම් ලෙස ගිණුම්ගත කර ඇතත් එම ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 03 මෙතෙක් පවරාගැනීමක් සිදු කර නොමැති බැවින් ඉඩම් පවරාගැනීමෙන් මැනීම් කටයුතු හා අදාල තක්සේරු කිරීමේ කටයුතු සිදුකර ගිණුම්ගත කිරීම සිදු කළ හැක. | නියමිත පරිදි වත්කම් කළමනාකරණය හා නිවැරදිව ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |
| (ඉ) | නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය සතු රු.මිලියන 04 කට තක්සේරු කර තිබුණ ජීප් රථය සහ පාපැදි 05 ක වටිනාකම CIGAS වත්කම් ලේඛනයේ රු. 100 බැගින් වූ වටිනාකමකට ඇතුලත් කර තිබුණු අතර තක්සේරු වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ මෝටර්රථ පරීක්ෂක/ඉන්ජිනේරු වෙත ඉදිරිපත්කර නිවැරදි තක්සේරු කිරීමකින් පසු සත්‍ය වටිනාකම ගිණුම්ගත කිරීමට ඉදිරියේදි පියවරගනු ලැබේ. වත්කම් ලේඛනයේ පාපැදි අයිතමයක් නොමැති බැවින් මෝටර්සයිකල් අයිතමය යටතේ ඇතුලත් කර ඇත.එය ඉදිරියේදී නියමිත තක්සේරුවකින් පසු සත්‍ය වටිනාකම් ඇතුලත් කර නිවැරදි කිරීමට අවශ්‍ය පියවරගනු ලැබේ. | නියමිත පරිදි වත්කම් කළමනාකරණය හා නිවැරදිව ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |
| (ඊ) | අමාත්‍යාංශය සතු වාහන 12 ක වටිනාකම වත්කම් ලේඛනයට ඇතුලත්කර කර නොතිබුණි. | CIGAS මෘදුකාංගය වෙත ඇතුලත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | නියමිත පරිදි වත්කම් කළමනාකරණය හා නිවැරදිව ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |

**1.6.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

විගණනයේදී නිරීක්ෂණයන් වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10.(ආ) | සැපයුම්කරු කොන්ත්‍රාත්තුව ඉටු නොකිරීමෙන් අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා කාර්යසාධන බැදුම්කරයක් ලබා ගත වුවත් මාර්ගෝපදේශ ප්‍රකාරව රු. මිලියන 16 ක් වටිනා ක්‍රීඩා උපකරණ සැපයීම සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සැපයුම් ආයතනය විසින් ලංසු සුරක්ෂණය වෙනුවෙන් රු.250,000 ක මුදලක් මෙම අංශය වෙත තැන්පත් කරන ලදී. මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමෙන් අනතුරුව උක්ත ව්‍යාපෘතියෙහි කාර්යය සාධන සුරක්ෂණය වෙනුවෙන් රු.142,740 ක මුදලක් රඳවාගෙන තබා ගන්නා ලද අතර, අතිරික්ත මුදල වන රු.108,260 ක් නිදහස් කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 10 ක එකතුව රු. මිලියන 15 ක් වූ ප්‍රතිපාදන හා මූලධන වැය විෂයන් 10 ක එකතුව රු. මිලියන 76 ක් වූ ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි. පුනරාවර්තන වැය විෂයයන් 55 ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 24 කට අදාළව ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු පුනරාවර්තන ප්‍රදාන රු. මිලියන 552 ක් හා මූලධන ප්‍රදාන රු. මිලියන 808 ක් බැගින් එකතුව රු. මිලියන 1,360 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. ප්‍රතිපාදන ඉතිරිවීම් එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 97 දක්වා පරාසය තුල පැවතුණ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 03/2022 අයවැය චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වියදම් පාලනය කිරීම මේ සඳහා හේතු ලෙස දක්වා තිබුණි. | රටතුළ පැවති අර්බුධකාරී වාතාවරණය හා 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයෙහි ඇති විධිවිධාන වලට අනුකූලව කටයුතු සිදු වීම හා අංක BD/HRD/194/16/2022 හා 2022.06.06 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් යුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව රාජ්‍ය මූල්‍ය කෙරෙහි ඇති වී තිබෙන පීඩනය අවම කිරීම සිදු කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන අවුරා තැබිය යුතු වැය විෂයයන් හඳුනාගෙන ඇතිබව දැනුම් දී තිබීම හේතුවෙන් වැය විෂයන් තුල ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු ඇත. | කාර්යක්ෂම ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කළ යුතු වීම. |

## 2.2 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට පැවති ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළව වර්ෂ 2 සිට 07 දක්වා කාලයක සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබූ රු. මිලියන 61 ක් වූ තැන්පතු 42 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොාතිබුණි. | රු.18,935,194 ක් වන තැන්පතු මුදලින් රු.14,107,960 ක් තැන්පතු ගිණුමෙන් නිදහස් කිරීමට හඳුනාගෙන ඇති නමුත් අක්මුදල් නොමැති වීම හේතුවෙන් අදාල ආයතන වලට ගෙවීම නතර වී ඇති අතර එම එම තැන්පතුවෙන් රු.390,839 ක් දැනට නිදහස් කර ඇත.<br>එමෙන්ම ඉහත තැන්පතු අතරින් තැන්පතු 16ක්වූ රු.9,222,890 ක මුදලක් රජයේ ආදායමට බැර කිරීමට හඳුනා ගෙන ඇත.<br>ඉතිරි තැන්පතු 25 සම්බන්ධ ව්‍යාපෘති නිසි පරිදි අවසන් වී ඇත්ද යන්න හා නිදහස් කිරීඹට පවතින දුෂ්කරතා සම්බන්ධ සොයා බලා නිරවුල් කිරීම සඳහා කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම** | | |
| (i) | රු.මිලියන 120.5 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබුණු ව්‍යාපෘති 8 ක් ප්‍රාග්ධන අක්මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සහ වියදම් කළමණාකරණයට අදාලව නිකුත් වූ අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි. | අදාල ව්‍යාපෘති සඳහා කාර්යය ඉටුකිරීමේදී 03/2022 චක්‍රලේඛ ප්‍රකාරව නව වැඩ ආරම්භ කිරීමක් සිදු නොකරන ලෙස ලබා දී තිබූ උපදෙස් පරිදි කටයුතු කිරීම හේතු වී ඇත. ප්‍රාග්ධන අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීමද මෙම තත්වයට හේතු වී ඇත. | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර මනා කාර්යක්ෂමතාව යෙන් හා අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති සැලසුම් කළ යුතු වීම. |
| (ii) | කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම සඳහා රු. මිලියන 12 ක් ඇස්තමේන්තු කර 2018 මාර්තු 28 දින රු. මිලියන 12 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 6 කින් නිම කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් පරිපාලනයේ විවිධ දුර්වලතා | ආරම්භක අදියරේ දී ඇතිවූ ගැටලුකාරී තත්ව මත මෙම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව විසින් සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකමක් සඳහා අනුමැතිය ලබා දී ඒ අනුව, ව්‍යාපෘතිය නැවත ආරම්භ කර ඇත. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම් අනුව කාලය දීර්ඝ කිරීම් තාක්ෂණික ඇගයීම් | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර මනා කාර්යක්ෂමතාව යෙන් හා අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි |

| | | |
|---|---|---|
| හේතුවෙන් ගෙවිය යුතු මුදලට වඩා රු. මිලියන 4 ක් (බදු සහිත) අමතරව ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණු අතර පිටියේ නියමිත ප්‍රමිතියට අනුව තිබිය යුතු ඉඩ ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි. ව්‍යාපෘතියේ I වන අදියර පමණක් සිදුකර තිබුණ අතර දුනු විදීම හා වෙඩි තැබීමේ ක්‍රීඩා සඳහා ක්‍රීඩා පිටිය භාවිතා කළ නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගත නොහැකි වී තිබුණි. | කමිටුව විසින් අනුමත කර තිබුණි. ඒ අනුව, 2020 මැයි 10 දින සම්පූර්ණ කිරීමට නියමිත ව තිබූ මෙම ව්‍යාපෘතිය, වැඩ අවසන් කර 2020 මැයි 15 දින පාසල වෙත භාර දී ඇත.<br>අමතර වැඩ සඳහා විධිමත් අනුමැතිය ලබා නො ගැනීම සම්බන්ධව කොන්ත්‍රාත් ආයතනයෙන් සහ උපදේශන ආයතනයෙන් ලිඛිත විමසීම් සිදු කර ඇත.<br>ව්‍යාපෘතියේ අදියර II ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව තාවකාලිකව අත්හිටුවා ඇත. | ව්‍යාපෘති සැලසුම් කළ යුතු වීම.<br>ඇස්තමේන්තු වැඩ වටිනාකම ඉක්මවා කටයුතු කිරීමේදී විධිමත් පරිදි අනුමැතිය ලබා ගත යුතුය. |

**(ඇ) යටිතල පහසුකම් අංශය විසින් ඉටුකළ ව්‍යාපෘති**

**(i) ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම**

| | | |
|---|---|---|
| ක්‍රීඩා සමාජ මෙන්ම ක්‍රීඩා කටයුතුවල යෙදෙන යෞවන සමාජ සමාජිකයන්ට සහ ක්‍රීඩා පාසල් සඳහා අවශ්‍ය වන ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර තිබුණ ද අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගත් පුද්ගලික සැපයුම් ආයතන 3ක් විසින් ගිවිසුම් ප්‍රකාරව රු. මිලියන 24 ක් වූ වොලිබෝල් කනු, නෙට්බෝල් කනු, පාපන්දු ගෝල කනු, වොලිබෝල් දැල්, පාපන්දු යනාදී ක්‍රීඩා උපකරණ සපයා නොමැති බැවින් හා එක් ආයතනයක් විසින් රු. මිලියන 6 වූ ක්‍රීඩා උපකරණ සැපයිය නොහැකි බව දැන්වීම හේතුවෙන් එකතුව රු. මිලියන 30 ක් වූ ක්‍රීඩා උපකරණ සපයා නොමැති බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි. රු. මිලියන 17 ක වටිනාකමට අදාල භාණ්ඩ සැපයිය යුතු කාලසීමාව වර්ෂ 1 හා මාස 07 ක් පමණ ඉක්මවා ගොස් තිබුණි. | නියමිත ප්‍රමිතියෙන් භාණ්ඩ ලබා දීමට අපොහොසත් වූ ඇතැම් ආයතනවල කාර්යසාධන සුරක්ෂණය පවරාගෙන ටෙන්ඩරය අවලංගු කරන ලදි. ආනයන සීමා කිරීම් හා ආනයනික ක්‍රීඩා භාණ්ඩ වල මිල ඉහළ යාම හේතුවෙන් රු. තිබුණි 17 ක්වූ භාණ්ඩ ලබා දීම ප්‍රමාද විය. නමුත් 2023 වර්ෂයේදී එම ඇණවුම බෙදා අවසන් කරන බවට අදාළ ආයතනයේ කළමණාකාරිත්වය විසින් දැනුම් දෙන ලදි. | වැඩසටහන් ක්‍රමවත්ව කලමනාකරණය සහ නියාමනය සිදු කල යුතු වීම. |

**(ii) මහජන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන**

| | | |
|---|---|---|
| මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂයේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ හා බිල්පත් පියවීමට නොහැකි වූ ව්‍යාපෘති 09 ක් 2022 වර්ෂයේදී අවිච්ඡේද ව්‍යාපෘති ලෙස ආරම්භ කර තිබුණ අතර එය සඳහා රු.මිලියන 33 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. රටෙහි පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැයට වඩා ව්‍යාපෘති වැඩ වටිනාකම ඉහළයාම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂයේ රටෙහි පැවති ආර්ථික තත්ත්වය හමුවේ සීඝ්‍රයෙන් අමුද්‍රව්‍ය මිල ඉහළ යාම, අමුද්‍රව්‍ය ආනයන සීමා පැනවීම, ඉන්ධන හිඟය හා මිල ඉහළ යාම හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා ඇතිවීම, අවිච්ඡේද වූ ව්‍යාපෘති 09 ක් අවලංගු වීමට හා ඉදිරියට ක්‍රියාත්මක නොවීමට හේතු වී ඇත | ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කලමනාකරණය සහ නියාමනය සිදු කල යුතු වීම. |

## 3.2 කොන්ත්‍රාත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර් ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමේ දී 2017 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන රු.මිලියන 606 ක් වියදම් කර තිබුණි. රු මිලියන 487 ක් වැය කර ඇති මීටර් 400 කෘතිම ධාවන පථයේ තරග සඳහා සහභාගී වන ක්‍රීඩකයින් අපහසුතාවයට පත්වන අයුරින් ස්ථාන කිහිපය පළුදු වී පැවතීම හා මන්තීරු වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබුණි. ක්‍රීඩා සඳහා භාවිතා කල නොහැකි තත්වයේ පවතින පැරණි ධාවන පථය පිහිටි ප්‍රේක්ෂකාගාරයේ වහලය සුළං තත්ත්වයන් නිසා ගැලවී ගොස් තිබුණි. රු මිලියන 34 ක් වැය කර ඇති කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වුවද එහි ගිවිසුම අවලංගු කර තිබුණි. විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු මිලියන 30 ක් වැය කර සියයට 65 ක ඉදිකිරීම් ප්‍රගතියක් පැවතියදි ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණි. මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු රජයේ ඉදි කිරීමේ ආයතනයක් මගින් ඉදි කර ගැනීම සඳහා 2019 වර්ෂයේදී ගිවිසුමක් ඇති කර නොගෙන රු.මිලියන 5.4 ක් අත්තිකාරම් ලෙස ගෙවා ඇතත් එම ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ගෙවූ මුදල අයකර ගැනීමට නොහැකි | නව කෘතිම ධාවන පථය වර්තමානයේ දී ක්‍රීඩා තරඟ සඳහා භාවිත කරනු ලබයි. පැරණි ධාවන පථය වර්තමානයේ ක්‍රීඩා තරඟ සඳහා භාවිත නොවන අතර, මෙම කෘතිම ධාවන පථය අතුරා බොහෝ කාලයක් ගත වී ඇති බැවින් සිදු වන පාරිසරික බලපෑම් හා භාවිතය හේතුවෙන් කෘතිම ඇතුරුම ගෙවී යාම හා පලුදු වීම් ඇති වීම සාමාන්‍ය තත්වයකි.<br><br>පැරණි ප්‍රේක්ෂකාගාරයේ වහලය සුළං තත්වය නිසා ගැලවී යාම සිදු වී ඇති අතර, එය නැවත ඉදිකිරීම සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් වී ඇත. ඒ සම්බන්ධව මූලික සැලසුම් සකස් කරමින් පවතී.<br><br>කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් භෞතික ප්‍රගතිය 90%කි. ගිවිසුම අවලංගු කර ඇති අතර ගෙවීම් සිදු කර ඇත්තේ සිදු කර ඇති වැඩ කොටස් සඳහා පමණි.<br><br>විදුලි ජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය තවදුරටත් කර ගෙන යාමේ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් දෙපාර්ශ්වයේ ම එකඟතාව මත ව්‍යාපෘතිය අවසන් කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල්(ඉංජිනේරු) වෙත දැනුම් දී ඇත. | ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කලමනාකරණය සහ නියාමනය සිදු කල යුතු වීම. |

| | |
|---|---|
| වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන් ඉටු නොවීම හේතුවෙන් ආයෝජිත මුදලට අපේක්ෂිත ප්‍රතිලාභයක් අත්කර ගෙන නොතිබුණි. | මුළුතැන්ගෙය අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා අත්තිකාරම් මුදල් ලබා දීමේ දී ගිවිසුම් අත්සන් කිරීමක් සිදු කර නොමැත. එම මුදල අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ එයට අයත් ක්‍රීඩා ව්‍යාපාර සංවර්ධන අංශය,නායකත්ව ජාතික මධ්‍යස්ථානය,ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය,ක්‍රීඩා වෛද්‍ය ආයතනය හා යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 29 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 59 ක්ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 134 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 81 ක් ඇතුළු මුළු පුරප්පාඩු සංඛ්‍යාව 303 ක් පැවතුණි. මෙම පුරප්පාඩු තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බෙහෙවින් වැදගත්වන කාර්යමණ්ඩල ඌනතාවයන් පැවති අතර එයට අමතරව නායකත්ව සංවර්ධන ජාතික මධස්ථානයේ පුහුණු හා පර්යේෂණ සහකාර/සංවර්ධන තනතුරු 11ක් සහ කාර්යාල සහායක සේවයේ තනතුරු 2ක් අතිරික්තව පවතුණි. | අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින තනතුරු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත කිහිප විටක් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන හිග කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |